## වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) - තනතුරු 01

**1. සේවා ගණය** - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය - (HM 1-1)

**2. සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 1 හෝ 2)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව, කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම.

**සමඟ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාප්ති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

(2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාප්ති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

(1) සපුරා තිබීම. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන / ව්‍යාප්ති කටයුතු පිළිබඳව කළමනාකාර MM 1-1 සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3. වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව රු. 140,640 - 15X4,100= 202,140/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**4. වයස** - අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමා බලපානු නොලැබේ.)

**5. බඳවාගැනීමේක්‍රමවේදය** (අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | | |
|---|---|---|---|
| 01. | අදාළ අතිරේක පළපුරුද්ද | - ලකුණු | 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් | - ලකුණු | 30 |
| 03. | අනෙකුත් කාර්යය සාධනයන් සහ කුසලතා | - ලකුණු | 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය | - ලකුණු | 25 |
| | **මුළු ලකුණු ගණන** | **ලකුණු** | **100** |

සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදුකෙරේ.

## තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී පුරප්පාඩු 25

**01. සේවා ගණය** - කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණය (MA 2-3- III)

**02. සුදුසුකම්** - **(අ) බාහිර අයදුම්කරුවන්**

කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය හෝ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම්

**03. වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව **රු. 52,700-10X800-11X1190-10X1320-10X1350 = 100,490/-** (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. මීට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**04. වයස** - අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**05. බඳවා ගැනීමේ ක්‍රමය** - පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසුව මෙම තනතුරට අදාළ ලිඛිත තරඟ විභාගයකින් හා පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරඟ විභාගය**

කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයට අයත් තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අදාළ වන ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය පහත දැක්වේ.

**ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය**

**ප්‍රශ්න පත්‍ර දෙකකි.**

1 පත්‍රය : කාලය පැය 01 කි.

බහුවරණ ප්‍රශ්න 50 ක් අඩංගුය.

විෂය නිර්දේශය: සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කෘෂිකාර්මික සිද්ධාන්ත, තේ තාක්ෂණය, තේ කර්මාන්තයට අදාළ කරුණු

ලකුණු : ප්‍රශ්න 50 × ලකුණු 2 බැගින් 100

II පත්‍රය : කාලය පැය 1 1/2 කි.

විෂය නිර්දේශය : කෘෂි කාර්මික මූලධර්ම, තේ අංශයට අදාළ කරුණු, තේ කර්මාන්තය හා තාක්ෂණය, කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදනය

**ප්‍රශ්න හා ලකුණු**

(i) කොටස

කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න ඉන් 6 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 6 X ලකුණු 05 = **ලකුණු 30**

(ii) කොටස

රචනාත්මක ප්‍රශ්න 7 කි.

ඉන් 5 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 5 × ලකුණු 14 = **ලකුණු 70**

එකතුව = **ලකුණු 100**

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර 2 සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද ලබාගත යුතුය.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | | | |
|---|---|---|---|
| 01. | අදාළ අමතර පළපුරුද්ද | ලකුණු | 30 |
| 02. | අදාළ අමතර අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් | ලකුණු | 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු | 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| | **මුළු ලකුණු ගණන** | | **100** |

ලිඛිත තරඟ විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලබන විට තරඟ විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.

**06. වෙනත්** - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළ දී ඔහුගේ / ඇයගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර අධිකාරිය විසින්15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භා අරමුදල් සඳහා 3% ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

**07. අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පළපුරුද්ද දැක්වෙන සහතික හා වෙනත් කුසලතා හා කාර්ය සාධනයන්හි සහතික යන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ / ඇයගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** - 2026 මාර්තු මස 10 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.**